**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2021

ඔක්තෝම්බර් - 2023

**BMGT E1015 - කළමනාකරණ මූලධර්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

**ප්‍රශ්න අංක 01 ඇතුළු ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න අංක 01 සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**

**ප්‍රශ්න අංක 01**

**පහත සඳහන් උපකල්පිත සිද්ධිය කියවා එහි අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.**

**'මෙලනිගේ හිතළු'**

සේවකයින් 50 දෙනෙකුගෙන් යුත් සමාගමක හිමිකාරිය වන මෙලනි, වෙනත් ව්‍යාපාරික කටයුතු සහ උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කිරීමට හැකි වන පරිදි සාමාන්‍යාධිකාරී (GM) තනතුර භාර ගැනීමට ඔබව බඳවා ගෙන ඇත. මෙයට හේතු වී ඇත්තේ ලොව පුරා සිදු වූ ආර්ථික පසුබෑම නිසා ඇයගේ ව්‍යාපාරයට ඇති වූ අහිතකර බලපෑම් සඳහා විසඳුම් සෙවීමටයි. අයහපත් ආර්ථික තත්ත්වයන්ගේ බලපෑම් හේතුවෙන් පසුගිය ජනවාරි මාසයේ සිට මාස දහයක කාලයක් තුළ සමාගම සමස්ත ආදායම සියයට 10 කින් පහත වැටීමක් පුරෝකථනය කර ඇති බව GM ලෙස ඔබ මෑතකදී සොයා ගත්තේය. තවද, මෙම කාලය තුළ සේවකයින් පස් දෙනෙක සමාගමෙන් ඉවත් වී යන බවද හඳුනාගෙන ඇත. සංවිධානයේ සෞඛ්‍ය සේවා පිරිවැය ද සියයට 11 කින් වැඩි වනු ඇතැයි මෙලනි පුරෝකථනය කර තිබුණි. ඇය තවදුරටත් සැලසුම් කර තිබුණේ සුබසාධන ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම කපා හැරීමට සහ තම සේවකයන් පූර්ණ කාලීනව සේවය සැපයීම වෙනුවට ඔවුන්ට කොන්ත්‍රාත් පදනම මත සේවය සැපයීමට සැලැස්වීමයි.

මෙම තොරතුරු සමඟ, වාර්තා සහ තත්ත්වයන් නිසි ලෙස විමර්ශනය කිරීමෙන් අනතුරුව පසුගිය මාස දහය තුළ සමාගමේ ආදායම සියයට 18 කින් පහත වැටී ඇති අතර සේවකයින් 12 දෙනෙකු

සමාගම හැර ගොස් ඇති බව ඔබ හඳුනාගෙන ඇත. තවද, සමාගමේ සෞඛ්‍ය සේවා පිරිවැය සියයට 16 කින් ඉහළ ගොස් ඇත. සුබසාධන ප්‍රතිලාභ කපා හැරීමට සහ සේවකයින් කොන්ත්‍රාත් පදනමින් වැඩ කිරීමට ඉල්ලා සිටීම, සේවකයන් රඳවා තබා ගැනීම සහ සමාගමේ විකුණුම් යන දෙකටම අහිතකර ලෙස බලපා ඇති බව GM ලෙස ඔබ තවදුරටත් සොයාගෙන ඇත.

GM ලෙස, ඔබ තවදුරටත් හඳුනාගෙන ඇත්තේ සමාගමේ අනාවැකි නිසි තොරතුරු මත පදනම් වී නොමැති අතර උපාය මාර්ග සකස් කර ඇත්තේ ප්‍රධාන වශයෙන් මෙලනිගේ පක්ෂග්‍රාහී සහ තවත් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ අනාවැකි කිහිපයක් මත පදනම්ව බවයි.

මෙලනි උසස් පෙළ අධ්‍යාපන කටයුතු අතරමග නවතා දමා ඇත්තේ වැඩිදුර ඉගෙනීමට වඩා ව්‍යාපාරයට යොමුවීම වැදගත් යැයි සිතාය. මූල්‍ය, අලෙවිකරණය, මානව සම්පත් සහ නිෂ්පාදනය සඳහා ඇය බඳවා ගත් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ද ඔවුන්ගේ ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති නමුත් උසස් අධ්‍යාපනය ලබා නොමැත. මෑතකදී ඉවත් වූ සේවකයින් ප්‍රධාන වශයෙන් අලුතින් බඳවා ගත් විධායකයින් සහ කළමනාකරුවන් වන අතර ඔවුන් පළමු උපාධි ලබා ඇති අතර ඔවුන්ගෙන් කිහිප දෙනෙකුට ශාස්ත්‍රපති උපාධි ද ඇත.

ඔබ ඉහත සඳහන් කළ තොරතුරු මුලදී සොයාගෙන තිබුණද, තවමත් සමාගමේ සැබෑ ගැටලුව කුමක්ද සහ ලබා දිය යුතු විසඳුම් මොනවාද යන්න නිවැරදිව සොයා ගැනීමට ඔබට අදහසක් නැත.

පහත දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන ලෙස ඔබෙන් ඉල්ලා සිටී:

අ) සිද්ධියේ විස්තර කර ඇති ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින්, සමාගම දැනට මුහුණ දෙන ගැටලුව/ගැටලු මොනවාදැයි හඳුනා ගන්න.

**(ලකුණු 08)**

ආ) ඉහත 'අ' ප්‍රශ්නයේදී ඔබ හඳුනාගත් ගැටලුව/ගැටලු නිර්මාණය කළ මූලික හේතුව/ හේතු මොනවාද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

**(ලකුණු 10)**

ඇ) සමාගමේ GM ලෙස, සමාගමේ සැලසුම් කිරීම සහ උපාය මාර්ග තෝරා ගැනීම සඳහා ඔබගේ උපදෙස් පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 28)**

**ප්‍රශ්න අංක 02**

අ) උදාහරණයක් භාවිතා කරමින්, එක් එක් පාරිසරික කොටසෙහි අවම වශයෙන් අයිතම දෙකක් විස්තර කරමින් ආයතනික පරිසරය සඳහා වර්ගීකරණයක් සපයන්න.

**(ලකුණු 06)**

ආ) උදාහරණයක් භාවිතා කරමින් තෝරාගත් සංවිධානයක ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන අවම වශයෙන් තුනක් (03) සඳහන් කරමින් SWOT විශ්ලේෂණය පැහැදිලි කරන්න;.

**(ලකුණු 12)**

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 03**

විවිධ කළමනාකරුවන් ආයතන තුළ විවිධ භූමිකාවන් ඉටු කළ යුතු අතර ඔවුන්ට විවිධ කුසලතා සහ නිපුණතා තිබිය යුතුයි.
ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

**(ලකුණු 18)**

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 04**

අ) සැලසුම්කරණය කළමනාකරණයේ හදවත බවට පත්වන්නේ ඇයි? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**(ලකුණු 09)**

ආ) නිදසුන් යෝග්‍ය ලෙස භාවිතා කරමින්, සංවිධානයක උපායමාර්ගික (strategic), උපායශීලී (Tactical) සහ මෙහෙයුම් (operational) සැලසුම් භාවිතය පෙන්වන්න.

**(ලකුණු 09)**

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 05**

අ) කළමනාකරණ ක්‍රියාවලිය සාර්ථකව කරගෙන යාමට පාලනය වැදගත් වන්නේ ඇයි?

**(ලකුණු 05)**

ආ) 'පෙර පෝෂණය' (Feedforward), 'ප්‍රතිපෝෂණ' (Feedback) සහ 'සමගාමී පාලනය' (Concurrent control) අතර වෙනස්කම් මොනවාද?

**(ලකුණු 06)**

ඇ) උදාහරණයක් භාවිතා කරමින් පාලන ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 06**

ආ) නායකත්වය යනු කුමක්ද?

**(ලකුණු 04)**

ආ) අනුහස් නායකත්වය (Carismatic leadership) යනු කුමක්දැයි සැබෑ ලෝකයේ දක්නට ලැබෙන උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

ඇ) සෑම කළමනාකරුවකුම තම තනතුරු බලය මත නායකයෙකු බවට පත්වේ. ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නේද? පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 07**

අ) සේවක අභිප්‍රේරණයේ වාසි හතරක් (04) ලැයිස්තු ගත කරන්න.

**(ලකුණු 04)**

ආ) අභ්‍යන්තර සහ බාහිර අභිප්‍රේරණය උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

ඇ) හර්ස්බර්ග්ගේ අභිප්‍රේරණය පිළිබඳ ද්වි සාධක න්‍යාය විස්තර කර සේවක රැකියා තෘප්තිය සහ අභිප්‍රේරණය වැඩි දියුණු කිරීමට කළමනාකරුවන්ට මෙම න්‍යාය භාවිතා කළ හැක්කේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 08**

අ) ඵලදායී සන්නිවේදනයේ ලක්ෂණ හතරක් (04) ලැයිස්තුගත කරන්න.

**(ලකුණු 04)**

ආ) සංවිධානයක සන්නිවේදනයේ මූලික අරමුණු මොනවාද?

**(ලකුණු 06)**

ඇ) ඵලදායී අන්තර් පුද්ගල සන්නිවේදනයට ඇති බාධක හඳුනාගෙන එම බාධක මග හරවා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

**(මුළු ලකුණු 18)**